ආකෘතිය (අංක 01)

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක - 290

ජනමාධ්‍ය අමාත්‍යාංශය

පළමු කොටස : 74.00		
අනු අංක	කම්ටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු තත්ත්වය නිවැරදි කිරීමට ආයතනය විසින් ගන්නා ලද ක්‍රියා මාර්ග
01.	ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	ස්ථාවර වත්කම් ලේඛනය මේ වන විට යාවත්කාලීන කර පවත්වාගෙන යනු ලැබේ.
02.	2004.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාර රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාල පළමු දෙවන සහ තෙවන මුරපද තුන්මසකට වරක් වෙනස් කර නොතිබුණි.	අදාල මුරපද තුන්මසකට වරක් වෙනස් කර පවත්වාගෙන යනු ලැබේ.
03.	විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	අමාත්‍යාංශය වෙත යොමු කරන විගණන විමසුම්වලින් 95% කට මසක් තුළ පිළිතුරු සැපයීමට මේ වන විට කටයුතු කර ඇත. ඇතැම් විගණන විමසුම් සඳහා අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවලින් පැහැදිලි කිරීම් ලබා ගත යුතුවන අතර එවැනි අවස්ථාවලදී මසක් ඇතුළත පිළිතුරු ලබා දීමට නොහැකි වන අවස්ථා උත්ගත වේ. කෙසේ වෙතත් එවැනි අවස්ථා හැකි සෑම විටම වළක්වා ගෙන නියමිත දිනට පිළිතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කෙරේ.
04.	විගණන හා කළමනාකරණ කම්ටු අවම වශයෙන් රැස්වීම් වාර 2ක් වත් පවත්වා නොතිබුණි.	මේ වන විට එම තත්ත්වය නිවැරදි කර වර්ෂය තුළ එම වර්ෂයට අදාළ කාර්තු හතරෙහිම විගණන හා කළමනාකරණ කම්ටු රැස්වීම් පවත්වා ඇත.
05.	2017.06.26 දිනැති අංක 1/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 7 ඡේදය ප්‍රකාරව 2018 වර්ෂයේදී මිලදී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2018 වර්ෂයේදී අපහරණය කරන ලද භාණ්ඩ නොතිබූ බැවින් ඒ පිළිබඳව තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොමැත.

06.	2017.06.26 දිනැති අංක 1/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 13 ඡේදය ප්‍රකාරව චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු නිලධාරියෙකු පත් කර කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත දන්වා නොතිබුණි.	මේ වනවිට නිලධාරියකු නම් කර කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත දන්වා ඇත.
07.	2020.08.28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 1 කොටසේ 11.1 ඡේදයේ සඳහන් කාල රාමුව ඇතුළත මූ.රෙ. 756(6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාල වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2023 වසරේ අදාල කාල රාමුවට අනුකූලව කටයුතු කිරීම සිදු කෙරේ.
08.	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	2023 වසරේ අදාල කාල රාමුවට අනුකූලව කටයුතු කිරීම සිදු කෙරේ.
09.	සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	භාවිතා කරනු ලබන සියළුම සංචිත වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර ඇත.
10.	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ආයතනය සතු වාහනවල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් කර නොතිබුණි.	කොරෝනා තත්ත්වය හේතුවෙන් එකම මාදිලියේ වාහනවලින් එක් වාහනය බැගින් තෝරා ගෙන ඉන්ධන දහන පරීක්ෂාව සිදු කරන ලදී.
11.	මූ.රෙ. 94 (1) ප්‍රකාරව වැය විෂයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව අනුමත සීමාවන් ඉක්මවා බැඳීම් ඇතිකර ගෙන තිබිණි.	මේ වන විට වර්ෂ අවසානයේ ඉතිරි ප්‍රතිපාදන ප්‍රමාණය සමාලෝචනය කර බැඳීම් ඇති කර ගැනීම සඳහා කටයුතු කෙරේ.
12.	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	අදාල ණය ශේෂ මේ වන විට සම්පූර්ණයෙන් නිරවුල් කර ඇත.
13.	මූ.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කර නොතිබුණි.	වර්තමානයේදී තත්කාර්ය අතුරු අග්‍රීම අදාළ කාර්ය නිමවී මසක් ඇතුළත නිරවුල් කිරීම කටයුතු යොදා ඇත.
14.	අනුමත අග්‍රිම ගිණුම් ශේෂ භාණ්ඩාගාරයේ පොත් සමඟ කාර්තුමය වශයෙන් සසඳනු ලබන අක්මුදල් සැසඳුම් ප්‍රකාශය නියමිත දිනට පෙර භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2022 වර්ෂයේ සිට අක්මුදල් සැසඳුම් ප්‍රකාශ නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.

දෙවැනි කොටස : **73.00**		
අනු අංක	**කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු**	**අඩුපාඩු තත්ත්වය නිවැරදි කිරීමට ආයතනය විසින් ගන්නා ලද ක්‍රියා මාර්ග**
01.	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	මානව සම්පත් සැලැස්ම මේ වන විට සකස් කර ඇත. යාවත්කාලීන කරමින් පවති.
02.	සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් කාර්ය මණ්ඩලයෙන් 50% කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	කොරෝනා වසංගත තත්ත්වය තුළ නිලධාරීන්ගේ පැමිණීම සීමා කිරීම මත මාර්ගගත පුහුණු වැඩමුළු සීමිත මට්ටමේ පැවැතුනි.
03.	සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	සමස්ථ කාර්ය මණ්ඩලය ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කරමින් පවති.
04.	සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබාදී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවැතුණි.	කොරෝනා වසංගත තත්ත්වය හා පැමිණීම සීමා කිරීම මත මාර්ග ගත පුහුණු වැඩමුළු සීමිත මට්ටමේ පැවතුනි.
05.	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය ව්‍යාවන මට්ටමේ හෝ අහිතකර මට්ටමේ විය.	2021 වර්ෂයට අදාළව ලබාදී ඇත්තේ තත්වාගණනය කල මතයකි. විගණනයේදී පෙන්වා දෙන අඩුපාඩු නිවැරදි කර සත්‍ය හා සාධාරණ විගණන මතයක් ලබා ගැනීමට කටයුතු කෙරේ.
06.	විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබිණි.	අදාළ නිර්දේශ මේ වන විට ක්‍රියාත්මක කර ඇත.